2025

# කාර්ය සාධන වාර්තාව
# செயற்றிறன்அறிக்கை
# Performance Report



ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
காணிஉபயோகக் கொள்கைத் திட்டமிடல் திணைக்களம்
**Land Use Policy Planning Department**

GUIDING FOR BETTER LAND USE

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

காணி உபயோகக் கொள்கைத் திட்டமிடல் திணைக்களம்

Land Use Policy Planning Department

# 2025

# කාර්ය සාධන වාර්තාව

**செயற்திறன்அறிக்கை**

# Performance Report

**පටුන** **පිටු අංක**


**01. ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශ** .................................................. 01

1.1. හැඳින්වීම .................................................................................................. 01

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු.................................................... 01

1.3. ප්‍රධාන කාර්යයන්........................................................................................ 02-03

1.4. සංවිධාන සටහන ........................................................................................ 04-5

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ .................................................................. 04

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල්............................... 04

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ................................................ 04

**02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම** ........................................................................ 06-08

**03. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ...................................................................... 09

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය................................................................. 10

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය...................................................................... 11

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්.................................................................................. 12

3.5. අදායම් එකතු කිරීමේ කාර්ය සාධනය......................................................... 13

3.6. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය................ 13

3.7. මූ.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.......................... 13

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ................................ 14

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව ............................................................... 14

**04. කාර්ය සාධන දර්ශක**

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)................... 15-16

**05. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ...................................... 17-19

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග................. 20

**06. මානව සම්පත් පැතිකඩ**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 21

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය ........ 21

6.3. මානව සම්පත් සංවර්ධනය ........ 22

**07. අනුකූලතා වාර්තාව** ........ 23-29

# 2025 වසර සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# ආයතනයේ නම :- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

# වැය ශීර්ෂ අංකය 327

## 01.පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කර, සම්මත කර ගැනීම සහ විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රමවේදයක් හඳුන්වා දීමේ අරමුණ ඇතිව වර්ෂ 1983 දී ඉඩම් අමාත්‍යාංශය යටතේ වූ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1654/21 සහ 2010 මැයි 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වශයෙන් සංස්ථාපනය කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 673ක් වන අතර, ජාතික මට්ටමේ සියලුම කටයුතු අධීක්ෂණය සහ මෙහෙයවීම අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලබන අතර, පාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන), සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) විසින්ද, ගිණුම් කටයුතු ප්‍රධාන ගණකාධිකාරී සහ ගණකාධිකාරී විසින් ද මෙහෙයවනු ලබයි. ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය කිරීමේ තාක්ෂණික කාර්යභාරය ඉඩම් පරිහරණ සැලසුම්, ශෂ්‍ය විද්‍යා, කෘෂි ආර්ථික විද්‍යා, සමාජ විද්‍යා සහ තොරතුරු පද්ධති විෂයන් යටතේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ කටයුතු දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාවට නැංවීම සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාල සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකටම අනුබද්ධිතව පිහිටුවා ඇති අතර, ඒවායේ කටයුතු අධීක්ෂණය සඳහා සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) වරුන් පත්කර ඇත. මෙම දිස්ත්‍රික් කාර්යාලවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් / සංවර්ධන නිලධාරීන් විසින් සියලුම ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරනු ලබයි.

### 1.2. දැක්ම

"ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීම."

### මෙහෙවර

පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ත ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහය වීම.

### අරමුණු

2010 අංක 1654/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට පහත අරමුණු යටතේ විෂය කටයුතු සංවිධානය කර ගැනීමේ වගකීම පැවරී ඇත.

01. ශ්‍රී ලංකාව සඳහා සම්මත කර ගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම.
02. ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම.
03. සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත්, පාරිසරික සමතුලිතතාවය රැකෙන පරිදිත් භාවිත කිරීමට හැකි වන සේ උචිත තාක්ෂණික මගපෙන්වීම සිදු කිරීම.
04. භූමිය පදනම් කර ගත් සංවර්ධන සැලසුම්වල දී එම සම්පතේ ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම.
05. විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුම පුහුණුව හා අධ්‍යයනය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.3. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

ඉහත අනු අංක 1:2 යටතේ දක්වන ලද දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමේ දී 2021.02.16 දින නිකුත් කරන ලද අංක 2215/20 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් ප්‍රමුඛතා ද සැලකිල්ලට ගෙන ඇත.

- ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ කාලීන අවශ්‍යතාවන්ට අනුව එය සංශෝධනය කිරීම.
- විවිධ මට්ටම්වලින් ඉඩම් පරිහරණ නිර්දේශ ඇතුළත් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සහ එම නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා පාර්ශවකාර ආයතන හඳුනා ගනිමින් අදාළ සම්බන්ධීකරණයන් සිදු කිරීම.

සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම ප්‍රධාන කාණ්ඩ 02ක් යටතේ සිදු කරනු ලැබේ.

**විශාල මට්ටමින් සිදුකරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු**

පළාත්, දිස්ත්‍රික්ක හෝ ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම මේ යටතට ගැනේ. ඒ අනුව, ඉඩම් පරිහරණ සැලසුම්වල ප්‍රායෝගික අවශ්‍යතාව හා ක්‍රියාත්මක කිරීමේ පහසුව සැකිල්ලට ගෙන නාගරික බල ප්‍රදේශවලට අයත් නොවන සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම ඉඩම් පරිහරණ සැලසුමක් සැකසීම සහ කාලීනව ඒවා යාවත්කාලීන කිරීමට ප්‍රමුඛත්වයක් ලබා දී ඇත.

**ක්ෂුද්‍ර මට්ටමින් සිදුකරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු**

මේ යටතේ සහභාගිත්ව ප්‍රවේශය තුළින් ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම, තෝරා ගත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර එම සැලසුම්වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ හායනයට පත්ව ඇති කෘෂිකාර්මික බිම් පුනරුත්ථාපනය සඳහා සැලසුම් සකස් කිරීම සිදු කරනු ලැබේ.

මෙයට අමතරව පහත කාර්යයන් ද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවනු ලැබේ.

- ඉඩම් පරිහරණය විධිමත් කිරීමට තීරණ ගැනීමේ පහසුව සඳහා තාක්ෂණික නිර්දේශ ලබා දීම.
- විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සහ ආයෝජන අවස්ථාවන් වෙනුවෙන් විවිධ ආයතනයන්හි ඉල්ලීම්වලට අනුව භූමි යෝග්‍යතා වාර්තා ලබා දීම.
- යාවත්කාලීන ඉඩම් පරිහරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙන යාම.
- භාවිතයට ගත හැකි, එහෙත් භාවිතයට නොගන්නා සහ ඌන භාවිත ඉඩම්වල ගැටළු හඳුනාගෙන එම ඉඩම් ප්‍රශස්ත ඵලදායිතාවක් සහිතව භාවිතයට ගැනීම සඳහා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් සම්පත මගින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම උදෙසා සැලසුම්කරණයේදී අවශ්‍ය දත්ත සම්පාදනයට ඉවහල් වන විවිධ මට්ටමේ සමීක්ෂණ පැවැත්වීම (උදා.-ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය / ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ සමීක්ෂණය, ජල මූලාශ්‍ර හඳුනා ගැනීමේ සමීක්ෂණය)
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු සම්බන්ධීකරණය.
- විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳව පාසැල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ විවිධ ප්‍රජා කණ්ඩායම් දැනුවත් කිරීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේදී මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉඩම් විෂය භාර අමාත්‍යාංශය ඇතුළු ප්‍රමුඛ රාජ්‍ය ආයතන ගණනාවක් හා ඒකාබද්ධව කටයුතු කරනු ලබයි.

ඉඩම් පරිහරණ සැලසුම්කරණය බහුවිධ විෂයක් වන බැවින්, ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ අනෙකුත් සමගාමී ආයතන හා එක්ව කටයුතු කිරීමට සෑම විටම සිදු වේ.

පහත සඳහන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන විවිධ මට්ටමින් හා විවිධ අවස්ථාවලදී දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා සම්බන්ධ වේ. එසේම එම ආයතන හා කටයුතු කිරීමේදී මෙම දෙපාර්තමේන්තුවේ දත්ත හා තොරතුරු මෙන්ම තාක්ෂණික දැනුම හුවමාරු කරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුව මගින් සකස් කරනු ලබන විවිධ මට්ටමේ සැලසුම්වල අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබීම මෙන්ම ඉඩම් සම්පත් කළමනාකරණය සඳහා අවස්ථාවන් පුළුල් කර ගැනීමටත් මෙම ඒකාබද්ධ ප්‍රවේශය මගින් හැකියාව ලැබී ඇත.

| **ආයතනය** | **දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා සම්බන්ධවීම** |
|---|---|
| 01.කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රතිපත්ති හා පවත්නා නීතිමය ප්‍රතිපාදනයන් පදනම් කර මගපෙන්වීම හා මෙහෙයවීම |
| 02. පරිසර අමාත්‍යාංශය | ජාතික මට්ටමේ පරිසර සංරක්ෂණ කමිටු සාමාජිකත්වය / අමාත්‍යංශයේ විවිධ ව්‍යාපෘති හා සම්බන්ධ වීම (උදා :- භූමි හායනය අවම කිරීමේ ව්‍යාපෘති, පාරිසරික සංවේදී ප්‍රදේශ ශ්‍රී ලංකාව සඳහා පරිමාණගත කිරීමේ වැඩසටහන) |
| 03. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | ඉඩම් යෝග්‍යතා වාර්තා ලබා දීම තුළින් සීමිත ඉඩම් සම්පත විද්‍යාත්මකව හා තාර්කිකව, විවිධ සංවර්ධන අවශ්‍යතා සඳහා වෙන් කර දීම. |
| 04. දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් | ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම හා දිස්ත්‍රික් / ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම |
| 05. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | කලාපීයකරණ සැලසුම් කමිටු නියෝජනය හා තොරතුරු සැපයීම |
| 06. නාගරික සංවර්ධන අධිකාරිය | නාගරීකරණ ප්‍රදේශ සඳහා කලාපීයකරණ සැලසුම් සැකසීමේ දත්ත හා තොරතුරු ලබාදීම |
| 07. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | ප්‍රධාන වැවිලි බෝග ඇතුළත් ප්‍රදේශ සිතියම් ගත කිරීම තුළින් ප්‍රධාන වැවිලි බෝග වගා ඉඩම් මනාව කළමනාකරණය කිරීම සඳහා දායකත්වය ලබා දීම |
| 08. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂිකාර්මික ඉඩම් සම්පත් කළමනාකරණය සඳහා සැලසුම්කරණයේදී අවශ්‍ය වන ඉඩම් පරිහරණ සිතියම් හා දත්ත ලබා දීම |
| 09. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම | ඉඩම් යෝග්‍යතා වාර්තා ඉදිරිපත් කිරීම හා ව්‍යාපෘති යෝජනා ඇගයීම, තාක්ෂණික කමිටු නියෝජනය |
| 10. වන සංරක්ෂණ හා වනජීවී අමාත්‍යාංශය | ආරක්ෂා කළ යුතු ප්‍රදේශ හා වන ආවරණය සහිත ප්‍රදේශවල මායිම් හඳුනා ගැනීම හා සිතියම්කරණය මෙන්ම ඉඩම් පරිහරණ සිතියම්වල අවකාශීය දත්ත හුවමාරු කර ගැනීම |
| 11. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගංගා ද්‍රෝණි තිරසරව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය යාවත්කාලීන ඉඩම් පරිහරණ දත්ත සහ ජල මූලාශ්‍ර පිළිබඳ දත්ත හා තොරතුරු ලබා දීම |

## 1.4 සංවිධාන සටහන

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව අනුමත කාර්ය මණ්ඩලය 673 කින් සමන්විත (A) ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවකි. ඉඩම් විෂය භාර අමාත්‍යාංශය යටතේ පවතින මෙම ආයතනයේ ප්‍රධාන කාර්යාලය, ආයතන, ගිණුම්, සංවර්ධන හා සැලසුම් සහ අභ්‍යන්තර විගණන යන අංශවලින් සමන්විත වන අතර, දීප ව්‍යාප්තව දිස්ත්‍රික් කාර්යාල 25ක් දිස්ත්‍රික්ක 25 නියෝජනය වන පරිදි පිහිටුවා ඇත. ප්‍රධාන කාර්යාලය මගින් ලබා දෙන තාක්ෂණික මගපෙන්වීම අනුව දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම දිස්ත්‍රික් කාර්යාල 25න් මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මෙම දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. මෙම සංවිධාන ව්‍යුහය පිටු අංක 05හි දක්වා ඇත.

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

(1) පාලන අංශය
(2) ගිණුම් අංශය
(3) සංවර්ධන හා සැලසුම් අංශය (දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල ඇතුළත්ව)
(4) අභ්‍යන්තර විගණන අංශය

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල්

**අදාළ නොවේ**

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

**අදාළ නොවේ**

# සංවිධාන ව්‍යුහය – ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව



# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

**අභියෝග.**

- ඉඩම් පරිහරණ සැලසුම් කාර්යයන් සඳහා විධිමත් නීතිමය රාමුවක් නොතිබීම සහ ඒ හේතුවෙන් දැනටමත් සකස් කර ඇති ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම නොමැති වීම
- විවිධ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සීමිත අයවැය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරීමට සිදුවීම.

**ඉදිරි ඉලක්ක**

- සංශෝධිත ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය අනුමත කරවා ගැනීම.
- සීමිත ඉඩම් සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම තුලින් තිරසර ඉඩම් භාවිතයක් මෙරට තුළ ස්ථාපිත කිරීමේ අරමුණින් ජාතික ඉඩම් පරිහරණ පනත අනුමත කරවා ගැනීම.
- අනාගත සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් විවිධ මට්ටම්වලින් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම.
- භූමි පරිහරණ / භූමි ආවරණ දත්ත යාවත්කාලීන කිරීම සහ සංවර්ධන අවශ්‍යතාවන් වෙනුවෙන් ඉල්ලුම් කරන පාර්ශව වෙත එම දත්ත / තොරතුරු ලබා දීම.
- තිරසර භූමි කළමනාකරණය පිළිබඳ විවිධ මට්ටමින් දැනුවත් කිරීම් සිදුකර භූමි කළමනාකරණය විධිමත් කිරීම.
- දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීම සඳහා දැනට පවතින කෘෂිකාර්මික ඉඩම් පරිහරණයේ ඇති අකාර්යක්ෂමතාවන්, ඌන භාවිතයන් හා හායනයට පත්වීම් කළමනාකරණය කිරීමට හැකි වීම සහ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා කෘෂිකාර්මික භූමි පරිහරණය සහිත ඉඩම් සඳහා කෘෂි වගා කළමනාකරණ පද්ධති වර්ගීකරණයක් (Farming System Classification) සැකසීම.
- ජල සම්පතෙහි පැවැත්ම සහ පෝෂණය පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වමින් උප ජලාධාර පරිසර පද්ධතීන්හි තිරසර බව තහවුරු කරමින් ඒවායේ භූමි පරිහරණයන් විධිමත් භූමි කළමනාකරණයක් වෙත යොමු කිරීමට හැකි වීම සඳහා තෝරා ගත් උප ජලාධාර (Sub River Basin) සඳහා භූමි පරිහරණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම.
- භාවිතා නොකළ සහ ඌන පරිහරණ ඉඩම් හඳුනාගෙන එම ඉඩම් ප්‍රශස්ත ඉඩම් පරිහරණයකට යොමු කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම.

**ප්‍රගතිය**

| අනු අංකය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කරන ලද ප්‍රධාන කාර්යයන් | ඇස්තමේන්තුගත වාර්ෂික පිරිවැය (රුපියල් මිලියන) | ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය % |
| | | | නිමැවුම | ප්‍රතිශතය % | |
| 01 | ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම, දත්ත හුවමාරුව සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය | 2.526 | | | |
| | 1.1 කෘෂිකාර්මික භූමි පරිහරණය සහිත ඉඩම් සඳහා කෘෂි වගා කළමනාකරණ පද්ධති වර්ගීකරණයක් (Farming System Classification) සැකසීම සහ වර්ගීකරණ සිතියම් සැකසීම පිළිබඳ නියමු ව්‍යාපෘති තුනක් (03) සිදු කිරීම | | නිම කරන ලද කෘෂිකාර්මික භූමි පරිහරණය සහිත ඉඩම් සඳහා කෘෂි වගා කළමනාකරණ පද්ධති වර්ගීකරණය | 100% | 100% |
| | 1.2 භූමි පරිහරණය / ආවරණය වර්ගීකරණ සූචකය - ශ්‍රී ලංකාව සඳහා වන රෙජිස්ට්‍රිය / ඉන්වෙන්ට්‍රිය / ලේඛනය සැකසීම | | නිමකරන ලද භූමි පරිහරණය / ආවරණය වර්ගීකරණ සූචකය - ශ්‍රී ලංකාව සඳහා වන රෙජිස්ට්‍රිය / ඉන්වෙන්ට්‍රිය / ලේඛනය සකස් කර අවසන් | 100% | 99% |
| | 1.3 2026 – 2030 දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් (Five Year Strategic Plan) සැකසීම | | අවසන් කරන ලද 2026 – 2030 දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස් කර ඇත. | 100% | 100% |
| 02 | දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | 6.6295 | දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් 24ක් සඳහා දත්ත රැස්කර අවසන් වී තිබීම | 100% | 99% |
| 03 | ජාතික ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීමට අදාළව දැනුවත් කිරීමේ හා අදහස් ලබා ගැනීමේ වැඩමුළුව | 0.402 | අවසන් කරන ලද ජාතික මට්ටමේ වැඩමුළුව | 100% | 100% |
| 04 | තෝරාගත් උප ජලාධාර (Sub River Basin) සඳහා භූමි පරිහරණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම | 4.6425 | තෝරා ගත් උප ජලාධාර 07ක් සඳහා භූමි පරිහරණ කළමනාකරණ සැලසුම් 07ක් නිමකර ඇත. | 100% | 100% |
| 05 | ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | 6.00 | ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් 100ක් සකසා අවසන් | 100% | 99% |
| 06 | පස හා ජල සංරක්ෂණය තුළින් ඌන පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම | 19.8 | පස සහ ජල සංරක්ෂණය තුළින් ඵලදායීතාවය ඉහළ නංවන ලද ව්‍යාපෘති 66 ක් සකසා අවසන් | 100% | 99% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 1.418 | දැනුවත් කිරීමේ වැඩසටහන් 333 පවත්වා අවසන් | 100% | 99% |
| 08 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම | 0.318 | කමිටු 76 ක් අවසන් | 100% | 98% |
| 09 | ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම | 1.2 | ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු 448 අවසන් | 100% | 99% |
| 10 | දිස්ත්‍රික් කාර්යාලවල මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 1.08 | රැස්වීම 300 ක් අවසන් | 100% | 96% |
| 11 | ප්‍රධාන කාර්යාලයේ කාර්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 0.484 | රැස්වීම 04 ක් අවසන් | 100% | 96% |

ජී.ඩී.එස්. ගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
අංක: 170, සිරුළු පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

අධ්‍යක්ෂ ජනරාල්

නම

තනතුර

දිනය 2026 / 02/20

# 03 – වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2025දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | සතය 2025 රු. | සතය 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 576,457,048 | 529,102,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 49,333,669 | 10,730,960 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 21,906,282 | 20,781,845 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 647,697,000 | 560,614,805 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 647,697,000 | 560,614,805 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | - | 18,388,083 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 647,697,000 | 542,226,722 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 516,225,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 513,293,463 | 451,555,724 | ඒසීඒ-2(ii) |
| 87,775,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 71,137,719 | 66,574,442 | ඒසීඒ-2(ii) |
| 4,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 3,635,241 | 3,961,018 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 608,000,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 588,066,424 | 522,091,184 | |
| | මූලධන වියදම් | | | | |
| 17,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 14,680,871 | 15,022,362 | ඒසීඒ-2(ii) |
| 8,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 8,331,554 | 12,149,282 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 3,000,000 | හැකියා වර්ධනය | 14 | 2,509,522 | 1,459,077 | ඒසීඒ-2(ii) |
| 44,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 43,965,035 | 43,210,929 | ඒසීඒ-2(ii) |
| 73,000,000 | මුළු මූලධන වියදම් (උ) | | 69,486,982 | 71,841,650 | |
| | තැන්පතු ගෙවීම් | | 49,498,079 | 10,214,101 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 23,874,525 | 23,339,917 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 73,372,604 | 33,554,018 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 730,926,010 | 627,486,852 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (83,229,010) | (85,260,130) | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (83,229,010) | (85,402,862.00) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | | 142,732.00 | ඒසීඒ-3 |
| | | | | (85,260,130) | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2025** | **2024** |
| | | රු. | රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසිඒ-6 | 585,143,805 | 548,265,024 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ-5/5(ඒ) | 45,429,799 | 43,461,557 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | - | 142,732 |
| මුළු වත්කම් | | **630,573,604** | **591,869,313** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 45,071,349 | 42,938,698 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 585,143,805 | 548,265,024 |
| කුලි හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසිඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසිඒ-4 | 358,450 | 522,859 |
| අග්‍රිම ශේෂය | ඒසිඒ-3 | - | 142,732 |
| මුළු වගකීම් | | **630,573,604** | **591,869,313** |

පිටු අංක 1 සිට 7 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වු ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 1 සිට 23 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ ඩී.ප වික්‍රමසිංහ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026.02.24 | දිනය : 2026/02/23 | දිනය : 2026/2/23 |

ලේකම්
කාමිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් මහ ලේකම් කාර්යාලය
නො.1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල

ඩබ්. කේ. එස්. රණසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
නො. 170, කිරුළ පාර,
නාරාහේන්පිට, කොළඹ 05

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-5

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සත්‍ය 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 32,718,986 | 25,631,115 |
| අග්‍රිම ලැබීම් | 576,457,048 | 529,102,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 22,477,413 | 22,214,162 |
| තැන්පතු ලැබීම් | 49,333,669 | 10,730,960 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 680,987,116 | 587,678,237 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 571,572,813 | 502,831,325 |
| සහනාධාර සහ මාරුකිරීම් | 3,635,241 | 3,961,018 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 12,949,832 | 17,928,056 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 12,070,533 | 751,294 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 18,388,083 |
| අත්තිකාරම් ගෙවීම් | 24,850,229 | 23,951,687 |
| තැන්පතු ගෙවීම් | 49,498,079 | 10,214,101 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 674,576,727 | 578,025,564 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | 6,410,389 | 9,652,673 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 6,410,389 | 9,509,941 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 6,410,389 | 9,509,941 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | (6,410,389) | (9,509,941) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ) | - | 142,732 |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | - | 142,732 |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | 142,732 |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තාකිරීමේ පදනම**

1) **පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) **මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු: "000"

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු. ) | අවසාන ඇස්තමේන්තුවේ % ලෙස |
| | ආදායම් නැත. | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 608,000,000.00 | 608,000,000.00 | 588,066,424.00 | 96.72% |
| ප්‍රාග්ධන | 73,000,000.00 | 73,000,000.00 | 69,486,982.00 | 95.19% |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු:

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම රු: | උප යෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසන් ප්‍රතිපාදන රු: | | |
| 01 | පරිසර අමාත්‍යාංශය | | 10,961,982.00 | 10,961,982.00 | 10,961,982.00 | 100% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම. |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 102,052,958.00 | 102,052,958.00 | - | 100% |
| 9152 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 298,431,919.00 | 298,431,919.00 | - | 100% |
| 9153 | ඉඩම් | 182,648,927.00 | 182,648,927.00 | - | 100% |
| 9154 | පරිගණක මෘදුකාංග | 2,010,000. 00 | 2,010,000.00 | - | 100% |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

( ඇමුණුම - i)

# 04 - පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කර ඇති ප්‍රධාන කාර්යයන් | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|
| | | | 100%90% | 75%-89% | 50%-74% | 50%-අඩු |
| 01 | ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම, දත්ත හුවමාරුව සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය | කෘෂි වගා කළමනාකරණ පද්ධති වර්ගීකරණ සංඛ්‍යාව<br>භූමි පරිහරණය/ ආවරණය වර්ගීකරණ සූචකය - ශ්‍රී ලංකාව සඳහා වන රෙජිස්ට්‍රිය/ ඉන්වෙන්ට්‍රිය/ ලේඛන සංඛ්‍යාව | | | | |
| | 1.1. කෘෂිකාර්මික භූමි පරිහරණය සහිත ඉඩම් සඳහා කෘෂි වගා කළමනාකරණ පද්ධති වර්ගීකරණයක් (Farming System Classification) සැකසීම සහ වර්ගීකරණ සිතියම් සැකසීම පිළිබඳ නියමු ව්‍යාපෘති තුනක් (03) සිදු කිරීම | | ✓ | - | - | - |
| | 1.2. භූමි පරිහරණය/ ආවරණය වර්ගීකරණ සූචකය- ශ්‍රී ලංකාව සඳහා වන රෙජිස්ට්‍රිය / ඉන්වෙන්ට්‍රිය / ලේඛනය සැකසීම | | ✓ | - | - | - |
| | 1.3. 2026–2030 දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් (Five Year Strategic Plan) සැකසීම | 2026 – 2030 දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපායමාර්ගික සැලසුම | ✓ | - | - | - |
| 02 | දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | සකස් කරන ලද සැලසුම් සංඛ්‍යාව | ✓ | - | - | - |
| 03 | ජාතික ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීමට අදාලව දැනුවත් කිරීමේ හා අදහස් ලබා ගැනීමේ වැඩමුළුව | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | ✓ | - | - | - |
| 04 | තෝරාගත් උප ජලාධාර (Sub River Basin) සඳහා භූමි පරිහරණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම | සකස් කරන ලද සැලසුම් සංඛ්‍යාව | ✓ | - | - | - |
| 05 | ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | නිම කරන ලද සැලසුම් සංඛ්‍යාව | ✓ | - | - | - |
| 06 | පස හා ජල සංරක්ෂණය තුලින් ඌන පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම | නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ✓ | - | - | - |
| 07 | විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | නිම කරන ලද විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | ✓ | - | - | - |

| අනු අංකය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කර ඇති ප්‍රධාන කාර්යයන් | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|
| | | | 100%-90% | 75%-89% | 50%-74% | 50%-අඩු |
| 08 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම | පවත්වා අවසන් කරන ලද කමිටු සංඛ්‍යාව | ✓ | - | - | - |
| 09 | ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම | පවත්වා අවසන් කරන ලද කමිටු සංඛ්‍යාව | ✓ | - | - | - |
| 10 | දිස්ත්‍රික් කාර්යාලවල මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | පවත්වා අවසන් කරන ලද රැස්වීම් සංඛ්‍යාව | ✓ | - | - | - |
| 11 | ප්‍රධාන කාර්යාලයේ කාර්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | පවත්වා අවසන් කරන ලද රැස්වීම් සංඛ්‍යාව | ✓ | - | - | - |

# 05 - පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු.

| අනු අංකය | දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම් (ක්‍රියාත්මක සැලැස්මට අනුව ) | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (වර්ෂ අවසාන භෞතික ප්‍රගතියට අනුව ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 0%-49% | 50%-74% | 75%100% |
| 01 | ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම, දත්ත හුවමාරුව සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය<br>1.1 කෘෂිකාර්මික භූමි පරිහරණය සහිත ඉඩම් සඳහා කෘෂි වගා කළමනාකරණ පද්ධති වර්ගීකරණයක් (Farming System Classification) සැකසීම සහ වර්ගීකරණ සිතියම් සැකසීම පිළිබඳ නියමු ව්‍යාපෘති තුනක් (03) සිදු කිරීම | 2<br>13<br>15 | 2.2.3,<br>2.4,<br>2.4.1,<br>2.5,<br>2.5.1,<br>2.5.2,<br>13.1<br>13.2,<br>15.1,<br>15.2,<br>15.3,<br>15.4,<br>15.5,<br>15.9 | - | - | - | ✓ |
| | 1.2 භූමි පරිහරණය /ආවරණය වර්ගීකරණ සූචකය - ශ්‍රී ලංකාව සඳහා වන රෙජිස්ට්‍රිය/ ඉන්වෙන්ට්‍රිය/ ලේඛනය සැකසීම | 13<br>15 | 13.1,<br>13.2,<br>15.1,<br>15.2,<br>15.3,<br>15.4,<br>15.5,<br>15.9 | - | - | - | ✓ |
| | 1.3 2026–2030 දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් (Five Year Strategic Plan) සැකසීම | 1<br>2<br>12<br>13<br>15 | 1.2, 1.4,<br>1.5, 1.6<br>2.3, 2.4,<br>2.4.1,<br>2.5,<br>2.5.1,<br>2.5.2,<br>12.2,<br>13.1,<br>13.2,<br>13.3,<br>15.1,15.2<br>15.3,15.4<br>15.5,15.9 | - | - | - | ✓ |

| අනු අංකය | දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම් (ක්‍රියාත්මක සැලැස්මට අනුව ) | ඉලක්කය /අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (වර්ෂ අවසාන භෞතික ප්‍රගතියට අනුව ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 0%-49% | 50%-74% | 75%100% |
| 02 | දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | 1<br>2<br>5<br>7<br>11<br>13<br>15 | 1.2, 1.4,<br>1.5, 1.6,<br>2.3, 2.4,<br>2.4.1<br>2.5, 2.5.1,<br>2.5.2, 7.2<br>11.1, 11.3,<br>11.4,<br>11.5, 11.6,<br>11.7, 11.8<br>15.1, 15.2,<br>15.3<br>15.4, 15.5,<br>15.9 | - | - | - | ✓ |
| 03 | ජාතික ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීමට අදාළව දැනුවත් කිරීමේ හා අදහස් ලබා ගැනීමේ වැඩමුළුව | 1,2,<br>5,7,<br>11,13,<br>15 | 1,2,<br>5,7,<br>11,13,<br>15 | - | - | - | ✓ |
| 04 | තෝරාගත් උප ජලාධාර (Sub River Basin) සඳහා භූමි පරිහරණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම | 6<br>12<br>13 | 6.1, 6.2,<br>6.3, 6.4,<br>6.5, 6.6,<br>12.2, 13.1,<br>13.2 | - | - | - | ✓ |
| 05 | ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | 1<br>2<br>11<br>12<br>15 | 1, 2, 12, 15<br>1.2, 1.4<br>1.5, 1.6<br>2, 2.3<br>2.4<br>2.4.1<br>2.5<br>2.5.1<br>2.5.2<br>11, 11.8<br>15, | - | - | - | ✓ |
| 06 | පස හා ජල සංරක්ෂණය තුළින් ඌන පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම | 2<br>5<br>6<br>12<br>15 | 2, 2.3,<br>5,6, 6.4<br>6.5, 6.6,<br>12,12.2<br>15,15.2,<br>15.3 | - | - | - | ✓ |
| 07 | විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 5<br>6<br>12<br>13<br>15 | 5, 6, 6.4,<br>6.5, 6.6,<br>12, 12.2,<br>13, 13.3,<br>15, 15.1,<br>15.2, 15.3,<br>15.4, 15.5 | - | - | - | ✓ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 08 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම | 12<br>15 | 12.2<br>15.9 | - | - | - | ✓ |
| 09 | ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම | 12<br>15 | 12.2<br>15.9 | - | - | - | ✓ |
| 10 | දිස්ත්‍රික් කාර්යාලවල මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 12<br>15 | 12.2<br>15.9 | - | - | - | ✓ |
| 11 | ප්‍රධාන කාර්යාලයේ කාර්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 12<br>15 | 12.2<br>15.9 | - | - | - | ✓ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

මෙම දෙපාර්තමේන්තුව මූලිකවම සැලසුම් කාර්යයක නිරතවන බැවින් එම සැලසුම් වෙනත් පාර්ශවකාර ආයතන විසින් ක්‍රියාත්මක කිරීම තුළින් ජයග්‍රහණ ළඟා කර ගත යුතු වේ. එබැවින් ක්ෂණික ජයග්‍රහණ ලබා ගැනීම තරමක් දුෂ්කර වේ. එමෙන්ම, මෙම සැලසුම්වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රතිඵල ලැබීමට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීම ප්‍රතිඵල හෝ ජයග්‍රහණ සමග සෘජුව සම්බන්ධ කර ගැනීම අභියෝගයක් වේ.

# 06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

## 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 40 | 27 | 13 ඇබෑර්තු |
| තෘතීයික | 01 | 01 | - |
| ද්විතියික | 543 | 460 | 83 ඇබෑර්තු |
| ප්‍රාථමික | 89 | 76 | 13 ඇබෑර්තු |

## 06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි පුරප්පාඩු පැවතිය ද, පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් වැඩ බැලීම / රාජකාරි ඉටු කිරීම මත හෝ රාජකාරී ආවරණයට පත් කිරීම තුළින් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මට්ටමේ රාජකාරී කටයුතු ගැටළුවකින් තොරව පවත්වාගෙන යාම සඳහා පවතින මානව සම්පත් කළමනාකරණය කර ගැනීමට කටයුතු කර ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| කළමනාකරණ සේවා නිලධාරීන් සහ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීන් සඳහා ආයතනික පුහුණු වැඩසටහන | 32 | දින 01 | රු.109,674.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | 37 | දින 01 | රු.669,200.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| GIS Training Program | 95 | වැඩසටහන් 05 | රු.10,049,145.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| පාංශු සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 36 | දින 02 | රු.178,856.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| පාංශු පරීක්ෂණය පිළිබඳ එක් දින ප්‍රායෝගික පුහුණුව | 05 | දින 01 | රු.13,130.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| භූමි යෝග්‍යතා පිළිබඳ පුහුණුව | 15 | දින 02 | රු.30,535.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| නිවාඩු සම්බන්ධ පුහුණුව | 01 | දින 03 | රු.13,000.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය | 03 | දින 03 | රු.54,000.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| අභ්‍යන්තර විගණනය හා විමර්ශනය පිළිබඳ | 01 | දින 10 | රු.45,000.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| Earth Observation in the Age of AI | 02 | දින 02 | රු.12,000.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |
| මාණ්ඩලික හා ක්ෂේත්‍ර නිලධාරීන්ට පශ්චාත් උපාධි අවස්ථා හා පුහුණු අවස්ථා (දේශිය හා විදේශ පුහුණු) ලබා දීම | 03 | | රු.280,000.00 | - | දේශීය | දැනුම හා අවබෝධය තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවයන් වර්ධනය කිරීම තුළින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම.

# 07 - පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වානිජ අත්තිකාරම් ගිණුම) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උපපත්‍රිකා ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171 / 2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | - | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | - | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | - | - |
| 6.1 | මු.රෙ. 134(2) DMA /1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | - | - |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම | අනුකූල වේ | - | - |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය, ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | 2025 වර්ෂයට අපහරණය කිරීමට වාහන නොතිබීම | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල නොවේ | 2025 වර්ෂයට කල්බදු අවසන් වූ වාහන නොමැත. | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මූ.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | - | - | - |
| 15.2 | රැස් කර තිබු අදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම | - | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05 /2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම | අනුකූලවේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.1.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19..2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කර තිබීම | අනුකූලවේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | රා.ප.ච.02/2018(1) අනුව අවශ්‍ය නොවේ. | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම | අනුකූල වේ | | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | - | - | - |

51 a

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ARI/F/LUPPD/2/2025/16    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2026 මැයි 13 දින

ගණන්දීමේ නිලධාරි
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරි දිනකදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

Scanned with CamScanner

සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.



Scanned with CamScanner

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ). ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. බැරකම් හා බැඳීම්වලට එළඹීම

2026 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල පමණක් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීමේ දී 2025 වර්ෂයට අදාළ එකතුව රු. 369,442 ක් වූ වියදම් 2026 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු. 369,442 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.



Scanned with CamScanner

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 386 (4) වගන්තිය | නිකුත් කරනු ලබන සෑම චෙක්පතකම වලංගු කාල සීමාව එය ලියූ දින සිට දින 30 කට සීමා කළ යුතු වුවද චෙක්පත් 10ක් සම්බන්ධයෙන් චෙක්පත් ලියූ දින සිට දින 9 ත් 59 ත් අතර පරාසයක ප්‍රමාද කාලයකින් පසුව අදාල ආදායකයා වෙත භාර දී තිබුණි. |
| (ii) | මු. රෙ. 754 වගන්තිය | සෑම මුදල් වර්ෂයක් අවසානයේදී බඩු ලේඛන පොත තුලනය කළ යුතු වුවත් එපරිදි තුලනය කර නොතිබුණි. |

4. මෙහෙයුම් සමාලෝචනය

**4.1.** කාර්යසාධනය

4.1.1. දැක්ම හා මෙහෙවර

සීමිත ඉඩම් සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම තුලින් තිරසර ඉඩම් භාවිතයක් මෙරට තුල ස්ථාපිත කිරීමේ අරමුණ වෙනුවෙන් අවශ්‍ය ඉඩම් පරිහරණ පනත අනුමත කර ගෙන නොතිබුණි.

**4.2** වත්කම් කළමනාකරණය

4.2.1. ගබඩා පාලනය

(අ). 2015 වර්ෂයේ දී පමණ මිලදී ගෙන ඇති රු. 376,480 වටිනා Cartridge හා Toner වර්ග 14 ක් යටතේ වූ ඒකක 84 ක් 2025 දෙසැම්බර් 31 වන දින වනවිටත් වර්ෂ 10 කට අධික කාලයක් උපයෝජනයකින් තොරව ගබඩාවේ පැවැතිණි .

(ආ). වගා ව්‍යාපෘතිය යටතේ 2025 වර්ෂයේ දී ලැබී ඇති භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් බඩු වට්ටෝරු ලේඛනයට ඇතුලත් කර ඇති අතර ඒ පිළිබඳ 2026 පෙබරවාරි 12 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව පවර් බැන්ක් (Power Bank) 50ක්, පෙන් ඩ්‍රයිව් (Pen Drive) 49ක්, වැසි කබා (Rain coat) 06ක්, බෑග් (Back Pack) 09 ක්, හා Laptop Assuses 12ක ඌනතාවක් පැවති අතර ඉඩම් පරිහරණ දත්ත හා සිතියම් සංග්‍රහයෙන් පොත් 6ක ඌනතාවක්ද පැවතිණි.



Scanned with CamScanner

51 C

### 4.3. කළමනාකරණ දුර්වලතා

#### 4.3.1. ඉඩම් පරිහරණ දත්ත හා සිතියම් සංග්‍රහය

2024 වර්ෂයේ නොවැම්බර් මස ඉඩම් පරිහරණ දත්ත හා සිතියම් සංග්‍රහයේ එකක් රු.1731.63 බැගින් පිටපත් 600ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.1,038,978 ක් හා ඉඩම් පරිහරණ දත්ත සංග්‍රහයේ සාරාංශ පොතෙහි එකක් රු.2250 බැගින් පිටපත් 50ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.112,500ක් ලෙස එකතුව රු.1,151,478ක මුදලක් වැය කර තිබුණි. 2024 වර්ෂයේ සිට 2026 පෙබරවාරි 12 විගණන අවස්ථාව වන විට ඉඩම් පරිහරණ දත්ත සිතියම් සංග්‍රහයේ පොත් 516ක් ගබඩාවේ ඉතිරිව පැවතිණි. එක් පිටපතක් වෙනුවෙන් රු. 1,732.00 ක් වැය කර මුද්‍රණය කර ඇති මෙම පොතෙන් මාස 15ක් තුළ නොමිලේ ලබා දුන් පොත් සංඛ්‍යාව හැරුණු කොට පොත් 15ක් පමණක් අලෙවි වී තිබුණු අතර අවශ්‍යතාව ඉක්මවා පොත් මුද්‍රණය කර තිබුණි.

#### 4.3.2. අත්තිකාරම් B ගිණුම

3027 අංක දරණ නිලධාරිනියකගේ රු. 246,865 ක ණය ශේෂය PAYROLL – I -(01) සාමාජික ලේඛනයට අනුව වෙනත් ආයතනයකට නව පත්වීම ලබා ඇති බැවින් එම ණය නිරවුල් කර ඇති බවට සටහනක් යොදා තිබුණි. නමුත් PAYROLL – I -(03) සාමාජික ලේඛනයේ 3027 අංකය යටතේ වෙනත් නමක් සඳහන් වී තිබුණු අතර අයවිය යුතු ශේෂය ලෙස රු. 176,944 ක මුදල අත්තිකාරම් B ගිණුමේ ඇතුලත් වී තිබුණි. එකම සාමාජික අංකයෙන් සාමාජිකයින් දෙදෙනෙකුගේ නම් සහ ණය ශේෂ දෙකක් සඳහන් වීමෙන් නිවැරදි සාමාජිකයා හා නිවැරදි ණය ශේෂ හඳුනාගැනීමට අපහසු විය.

### 5. මානව සම්පත් කළමනාකරණය

#### 5.1. අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

#### 5.1.1. මානව සම්පත් කළමනාකරණය

(අ). 2025 වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාව 673 ක් විය. ඒ අනුව තථ්‍ය සංඛ්‍යාව 564 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 13 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 83 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 13 ක් සමඟ මුළු පුරප්පාඩු 109 ක් පැවතියද, සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තථ්‍ය නිමැවුම සියයට 96 ත් සියයට 100 ත් දක්වා පරාසයක තිබුණු බැවින් අනුමත සේවක සංඛ්‍යාවන් පිළිබඳව තවදුරටත් සමාලෝචනයක් සිදු කල හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ආ).දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහයට අනුව නීති නිලධාරි තනතුරක් අනුමත කර ඇතිමුත් එම තනතුර සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි.

එච්.එන්.රණතුංග
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට



Scanned with CamScanner